# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2208/32 - 2020 දෙසැම්බර් මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2020.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත

මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්තේ වන මම, 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 42 වන වගන්තිය යටතේ පැවරුණු බලතල ප්‍රකාරව ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීමේ, විධිමත් කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා පහත උපලේඛනයේ දක්වා ඇති ඉඩම අත්පත් කර ගැනීම අවශ්‍ය වන බව ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 49(අ) වගන්තියට අනුකූලව මෙයින් නියම කරමි.

ලොහාන් රත්වත්තේ,<br>
මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 31 වැනි දින,<br>
කොළඹ දී ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව සහ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාලු මුවදොර ග්‍රාම නිලධාරී වසමේ, ගාලු මුවදොර ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ අනුරේඛන අංක CO/COL/2018/787හි ලොට් අංක 1 මගින් දැක්වෙන පහත සඳහන් මායිම් තුළ පිහිටි හෙක්ටයාර් 0.1914 (අක්. 0, රූ. 1, පර්. 35.7)ක් පමණ වන ඉඩම.

| | | |
|---|---|---|
| උතුරට | : | සිරි උත්තරානන්ද මාවතේ වරිපනම් අංක සොයාගත නොහැකි රෝයල් සෙරමික් පුද්ගලික සමාගමට අයත් ඉඩම සහ සිරි උත්තරානන්ද මාවත, |
| නැගෙනහිරට | : | සිරි උත්තරානන්ද මාවත, |
| දකුණට | : | සිරි උත්තරානන්ද මාවතේ වරිපනම් අංක සොයාගත නොහැකි රේණුකා සමූහ ව්‍යාපාරය හිමිකම් කියන ඉඩම සහ මාකන් මාකර් මාවතේ, වරිපනම් අංක 58 දරන වයි. කේ. මාලක හිමිකම් කියන ඉඩම, |
| බස්නාහිරට | : | මාකන් මාකර් මාවතේ, වරිපනම් අංක 58 දරන වයි. කේ. මාලක හිමිකම් කියන ඉඩම, මාකන් මාකර් මාවතේ, වරිපනම් අංක සොයා ගත නොහැකි එස්. එච්. ජයකොඩි හිමිකම් කියන ඉඩම, පාර සහ මාකන් මාකර් මාවතේ, වරිපනම් අංක සොයාගත නොහැකි කේ. පී. එම්. ජී. පුද්ගලික සමාගම හිමිකම් කියන ඉඩම. |